# වෙළෙඳාම සහ සංචාරක කර්මාන්තය

පසුගිය වසර සමඟ සසඳන විට 1987 දී විදේශ වෙළෙඳ අංශයේ වෙනස්වීම් වාසිදායක විය. විගැහි වටිනාකම අනුව, 1986 දී සියයට 21 කින් පහත වැටුණු අපනයන වටිනාකම මේ වසරේ දී සියයට 4 කින් ඉහළ නැඟිණි. අනෙක් අතට, ආනයන වියදම 1986 වසරට වඩා සියයට 4 කින් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 1987 දී වෙළෙඳ ගිණුමේ හිඟය පසුගිය වසරේ හිඟය සමඟ සසඳන විට සියයට 18 කින් අඩු විය. වෙළෙඳ හිඟය අඩු වූ අනුක්‍රමික දෙවැනි වසර මෙය විය.

අපනයන අංශයේ වර්ධනයට විශාල වශයෙන් හේතු වූයේ රෙදිපිළි හා මැණික්වලින් ලද ඉපැයීම් ඉහළ යාමය. කෘෂිකාර්මික අපනයනවලින් ලත් ඉපැයීම් ද, රුපියල් වටිනාකම අනුව සියයට 11 කින් වැඩි වූ නමුත් විගැහි වටිනාකම අනුව සියයට 5 කින් පහත වැටුණි. 1987 දී තේ, රබර් හා පොල් නිෂ්පාදිතවල මිළ ගණන් මූර්ත වශයෙන් වැඩි වීම සලකන විට කෘෂිකාර්මික අපනයන ආදායම මූර්ත වශයෙන් පහත වැටීමට මුළුමනින්ම හේතු වූයේ ඒවායේ අපනයන පරිමාව අඩු වීමය.

තාවකාලික රේගු සංඛ්‍යාවලට අනුව, 1987 වසරේ ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 59,750 ක් (විගැහි දශ ලක්ෂ 1,568) වූ අතර අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 39,861 ක් (විගැහි දශ ලක්ෂ 1,046) විය. ඒ අනුව, වෙළෙඳ හිඟය රුපියල් දශ ලක්ෂ 19,889 ක් (විගැහි දශ ලක්ෂ 522) විය. මෙය ඉකුත් වසරේ වෙළෙඳ හිඟය වූ රුපියල් දශ ලක්ෂ 17,189 (විගැහි දශ ලක්ෂ 523) සමඟ සැසඳිය හැකිය. වාර්තා කිරීම සම්බන්ධයෙන් සිදුවන කාල පමාවන් සහ අනෙකුත් අතපසුවීම්වලට අදාළව රේගු සංඛ්‍යා ගලපනු ලැබීමෙන් පසුව, මුළු ආනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 60,517 ක් (විගැහි දශ ලක්ෂ 1,588) ද, මුළු අපනයන රුපියල් දශ ලක්ෂ 41,133 ක් (විගැහි දශ ලක්ෂ 1,080) ද විය. මෙසේ ගලපන ලද සංඛ්‍යාවලට අනුව, වෙළෙඳ හිඟය රුපියල් දශ ලක්ෂ 19,384 ක් (විගැහි දශ ලක්ෂ 509) වූ අතර, එය 1986 වසරේ රුපියල් දශ ලක්ෂ 20,487 ක් (විගැහි දශ ලක්ෂ 623) වූ වෙළෙඳ හිඟය සමඟ සසඳන විට විගැහි වටිනාකම අනුව සියයට 18 ක අඩු වීමක් පෙන්වීය.

**1 . 28 සංඛ්‍යා සටහන**

**වෙළෙඳ තුලනය 1985 – 1987**

රුපියල් දශ ලක්ෂ (වරහන් තුළ විගැහි දශ ලක්ෂ)

| වර්ෂය | ආනයන(අ) | | අපනයන(ආ) | | වෙළෙඳ තුලනය | |
|---|---|---|---|---|---|---|
| | රේගු | ගලපන ලද | රේගු | ගලපන ලද | රේගු | ගලපන ලද |
| 1985 .. | 49,069 (1,776) | 54,049 (1,956) | 35,035 (1,268) | 36,207 (1,311) | – 14,034 (– 508) | – 17,843 (– 646) |
| 1986 .. | 51,282 (1,559) | 54,559 (1,658) | 34,092 (1,036) | 34,072 (1,036) | – 17,189 (– 523) | – 20,487 (– 623) |
| 1987(ඇ) .. | 59,750 (1,568) | 60,517 (1,588) | 39,861 (1,046) | 41,133 (1,080) | – 19,889 (– 522) | – 19,384 (– 509) |

(අ) සන රන් හා කාසි ඇතුළත් නොවේ.
(ආ) ප්‍රතිඅපනයන ඇතුළත්ය.
(ඇ) තාවකාලිකයි.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන පොහොර ආනයනකරුවෝ,
සීමාසහිත එයාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

1987 වසරේ සාමාන්‍ය අපනයන මිළ ගණන් පසුගිය වසර සමඟ සසඳන විට වාසිදායක විය. මෙම මිළ වැඩි වීම, ආනයන මිළ ගණන් වැඩි වීමෙන් වූ අයහපත් බලපෑම් ද සමඟන් කොට වෙළෙඳ අනුපාතයේ වර්ධනයක් ඇති කිරීමට තරම් ප්‍රමාණවත් විය. වෙළෙඳ දර්ශකවලට අනුව, 1987 දී සාමාන්‍ය අපනයන මිළ සියයට 16 කින් වැඩි වූ අතර, ආනයන මිළ සියයට 13 කින් වැඩි විය. මිළ ගණන්වල මෙම සාපේක්ෂ වෙනස්වීම් හේතුකොටගෙන වෙළෙඳ අනුපාතය 1986 දී 111 සිට 1987 දී 114 දක්වා සියයට 3 කින් වර්ධනය විය.

**1 . 29 සංඛ්‍යා සටහන**

**විදේශීය වෙළෙඳාම 1979 - 1987**

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | දර්ශක අංක 1981 = 100 | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පරිමාව | | මිළ | | |
| | අපනයන* (නැ.වි.ස.) | ආනයන* (මි.ර.ගැ.) | වෙළෙඳ තුලනය | සියළුම අපනයන | සියළුම ආනයන (ආ) | සියළුම අපනයන | සියළුම ආනයන (ආ) | වෙළෙඳ අනුපාතය (ආ) |
| 1979 .. | 15,286 | 22,560 | - 7,275 | 89 | 94 | 82 | 68 | 121 |
| 1980 .. | 17,595 | 33,942 | - 16,347 | 95 | 111 | 92 | 86 | 107 |
| 1981 .. | 21,043 | 36,583 | - 15,540 | 100 | 100 | 100 | 100 | 100 |
| 1982 .. | 21,454 | 41,946 | - 20,492 | 105 | 100 | 98 | 104 | 94 |
| 1983 .. | 25,096 | 45,558 | - 20,461 | 99 | 110 | 125 | 109 | 115 |
| 1984 .. | 37,347 | 47,541 | - 10,194 | 116 | 114 | 160 | 114 | 140 |
| 1985 .. | 36,207 | 54,049 | - 17,843 | 120 | 109 | 142 | 123 | 115 |
| 1986 .. | 34,072 | 54,559 | - 20,487 | 128 | 124 | 126 | 114 | 111 |
| 1987(අ) .. | 41,133 | 60,517 | - 19,384 | 130 | 127 | 146 | 129 | 114 |

* 1980 සිට ඉදිරියට ගලපන ලද සංඛ්‍යා දැක්වේ.
(අ) තාවකාලිකයි.
(ආ) සංශෝධිත.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව.

**අපනයන**

ගලපන ලද සංඛ්‍යාවලට අනුව 1987 වසරේ අපනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 41,133 ක් (විගැහි දශ ලක්ෂ 1,080) වූ අතර, එය 1986 වසරේ රුපියල් දශ ලක්ෂ 34,072 (විගැහි දශ ලක්ෂ 1,036) සමඟ සසඳන විට රුපියල් වටිනාකම අනුව සියයට 21 ක ද, විගැහි වටිනාකම අනුව සියයට 4 ක ද වැඩි වීම් පෙන්නුම් කළේය. 1986 වසරේ වාර්තා වූ සියයට 6 ක (විගැහි වටිනාකම අනුව සියයට 21) අඩු වීම සමඟ සසඳන විට මෙය වැදගත් වර්ධනයක් විය. 1987 දී අපනයන ඉපැයීම් මෙසේ ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කාර්මික හා ඛනිජමය අපනයනවලින් ලද ඉපැයීම් වැඩි වීමය. කාර්මික අපනයන වටිනාකම 1986 දී රුපියල් දශ ලක්ෂ 15,878 (විගැහි දශ ලක්ෂ 483) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 20,004 (විගැහි දශ ලක්ෂ 525) දක්වා ඉහළ නැඟි අතර ඛනිජමය අපනයන ඉපැයීම් මේ දෙවසර තුළ දී රුපියල් දශ ලක්ෂ 1,182 (විගැහි දශ ලක්ෂ 36) සිට රුපියල් දශ ලක්ෂ 1,759 (විගැහි දශ ලක්ෂ 46) දක්වා වැඩි විය.

1987 වසරේ ශ්‍රී ලංකාවේ අපනයන අංශයෙහි වඩාත් අහිතකර ලක්ෂණය වූයේ ප්‍රධාන කෘෂිකාර්මික භාණ්ඩවල අපනයන පරිමාව තියුණු ලෙස පහත වැටීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාමාන්‍ය මූර්ත අපනයන මිළ ගණන් වැඩි වී තිබියදීත්, කෘෂිකාර්මික අපනයනවලින් ලද ඉපැයීම් 1986 දී විගැහි දශ ලක්ෂ 479 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 458 දක්වා මූර්ත වශයෙන් සියයට 5 කින් පහත වැටුණි. කෙසේවෙතත්, රුපියල් වටිනාකම අනුව කෘෂිකාර්මික අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 15,764 සිට රුපියල් දශ ලක්ෂ 17,437 දක්වා සියයට 11 කින් වැඩි විය.

තේ අපනයන වටිනාකම, 1986 දී රුපියල් දශ ලක්ෂ 9,253 ක් (විගැහි දශ ලක්ෂ 281) වූ අතර, 1987 දී එය රුපියල් දශ ලක්ෂ 10,654 ක් (විගැහි දශ ලක්ෂ 280) විය. මෙය රුපියල් වටිනාකම අනුව සියයට 15 ක වැඩි වීමක් පෙන්නුම් කළ නමුත් විගැහි වටිනාකම අනුව සුළු අඩු වීමක් විය. මෙම අඩු වීමට මූළමනින්ම හේතු වූයේ අපනයන පරිමාව, 1986 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 208 සිට 1987 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 201 දක්වා සියයට 3 කින් පහත වැටීමය. මෙයට ප්‍රතිවිරුද්ධ ලෙස සාමාන්‍ය අපනයන මිළ කිලෝග්‍රෑමයක් විගැහි 1.39 දක්වා විගැහි වටිනාකම අනුව සියයට 3 කින් ඉහළ නැඟිණි. එහෙත් රුපියල් වටිනාකම අනුව මෙම වැඩි වීම කිලෝග්‍රෑමයක් රුපියල් 52.97 දක්වා සියයට 19 ක් විය.

1987 වසරේ දක්නට ලැබුණු හිතකර මිළ උපනතීන් මෙන්ම විනිමය අනුපාතිකයේ හැසිරීම් ද පිළිබිඹු කරමින්, කොළඹ තේ වෙන්දේසිවල දී තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිළ රුපියල් 39.30 දක්වා සියයට 28 කින් වැඩි විය. එහෙත් ලන්ඩන් වෙන්දේසියේ දී ශ්‍රී ලංකා තේවලට ලැබුණු සාමාන්‍ය මිළ කිලෝග්‍රෑමයක් පැන්ස 115.67 සිට පැන්ස 105.21 දක්වා සියයට 9 කින් පහත වැටුණි.

1987 දී රබර් අපනයන පරිමාව කිලෝග්‍රෑම් දශ ලක්ෂ 106 දක්වා සියයට 4 කින් වඩාත් තියුණු ලෙස පහත වැටුණි. එහෙත්, සාමාන්‍ය අපනයන මිළ (නැ.වි.ස.) කිලෝග්‍රෑමයක් විගැහි 0.73 (රුපියල් 27.63) දක්වා සියයට 1 කින් (රුපියල් වටිනාකම අනුව සියයට 16) සුළු වශයෙන් වැඩි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විගැහි වටිනාකම් අනුව රබර් අපනයන ඉපැයීම්වල සියයට 4 ක පහත වැටීමක් වාර්තා විය. නමුත් රුපියල් වටිනාකම අනුව මෙය සියයට 12 ක වැඩි වීමක් විය.

සියළුම පොල් නිෂ්පාදිත අපනයන ඉපැයීම් 1986 දී රුපියල් දශ ලක්ෂ 2,389 (විගැහි දශ ලක්ෂ 73) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 2,140 (විගැහි දශ ලක්ෂ 56) දක්වා වඩාත් තියුණු ලෙස සියයට 23 කින් (රුපියල් වටිනාකම අනුව සියයට 10) අඩු විය. මෙයට විශාල වශයෙන් හේතු වූයේ පොල් මද නිෂ්පාදිතවල අපනයන වටිනාකම් 1987 දී රුපියල් දශ ලක්ෂ 1,423 (විගැහි දශ ලක්ෂ 37) දක්වා සියයට 24 කින් (රුපියල් වටිනාකම අනුව සියයට 12) සැළකිය යුතු ලෙස අඩු වීමය. අපනයන පරිමාව 1986 දී ගෙඩි සමක දශ ලක්ෂ 1,105 සිට 1987 දී ගෙඩි සමක දශ ලක්ෂ 538 දක්වා අඩකින් පමණ අඩු විය. ගෙඩියක මිළ 1986 දී රුපියල් 1.46 (විගැහි 0.044) සිට 1987 දී රුපියල් 2.64 (විගැහි 0.069) දක්වා සියයට 57 කින් (රුපියල් වටිනාකම අනුව සියයට 81) සැළකිය යුතු ලෙස ඉහළ ගිය ද, එහි වාසිදායක බලපෑම, අපනයන පරිමාවේ අඩු වීම මඟින් හිලව් විනි. පොල් අතුරු නිෂ්පාදිත අපනයන ඉපැයීම් 1987 දී රුපියල් දශ ලක්ෂ 717 (විගැහි දශ ලක්ෂ 19) දක්වා සියයට 21 කින් (රුපියල් වටිනාකම අනුව සියයට 8) පහත වැටුණි.

1987 දී සුළු කෘෂිකාර්මික අපනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,714 ක් (විගැහි දශ ලක්ෂ 45) වූ අතර එය 1986 වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 1,500 (විගැහි දශ ලක්ෂ 46) සමඟ සසඳන විට රුපියල් වටිනාකම අනුව සියයට 14 ක වැඩි වීමක් පෙන්විය. එසේ වුවත්, විගැහි වටිනාකම අනුව එය සුළු අඩු වීමක් විය. කෝපි, කරාබුනැටි හා කරදමුංගුවලින් ලද ඉපැයීම් කැපී පෙනෙන ලෙස අඩු වූ අතර ගම්මිරිස්, කුරුඳු, පළතුරු, කජු සහ තල ඇටවලින් ලද ඉපැයීම් සැළකිය යුතු ලෙස වැඩි විය.

## 1 . 30 සංඛ්‍යා සටහන

## අපනයන සංයුතිය 1985 – 1987

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු අපනයනවල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1985 | 1986 | 1987(ඈ) | 1985 | 1986 | 1987 | 1985 | 1986 | 1987 |
| 1. කෘෂිකාර්මික අපනයන .. | 19,026 | 15,764 | 17,437 | 689 | 479 | 458 | 52·5 | 46·3 | 42·4 |
| 1·1 තේ .. | 12,003 | 9,253 | 10,654 | 435 | 281 | 280 | 33·1 | 27·2 | 25·9 |
| 1·2 රබර් .. | 2,566 | 2,622 | 2,929 | 93 | 80 | 77 | 7·1 | 7·7 | 7·1 |
| 1·3 පොල් .. | 3,093 | 2,389 | 2,140 | 112 | 73 | 56 | 8·5 | 7·0 | 5·2 |
| 1·3·1 පොල් මද නිෂ්පාදිත .. | 2,383 | 1,609 | 1,423 | 86 | 49 | 37 | 6·6 | 4·7 | 3·4 |
| 1·3·2 වෙනත් .. | 710 | 780 | 717 | 26 | 24 | 19 | 1·9 | 2·3 | 1·8 |
| 1·4 සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (අ) .. | 1,365 | 1,500 | 1,714 | 49 | 46 | 45 | 3·8 | 4·4 | 4·2 |
| 2. කාර්මික අපනයන (අ) (ආ) .. | 14,295 | 15,878 | 20,004 | 517 | 483 | 525 | 39·5 | 46·6 | 48·6 |
| 2·1 රෙදිපිළි හා ඇඟළුම් .. | 7,960 | 9,629 | 12,897 | 288 | 293 | 339 | 22·0 | 28·3 | 31·4 |
| 2·2 ඛණිජ තෙල් නිෂ්පාදිත .. | 3,877 | 2,358 | 2,592 | 140 | 72 | 68 | 10·7 | 6·9 | 6·3 |
| 2·3 වෙනත් .. | 2,458 | 3,891 | 4,515 | 89 | 118 | 118 | 6·8 | 11·4 | 10·9 |
| 3. ඛණිජමය අපනයන .. | 864 | 1,182 | 1,759 | 31 | 36 | 46 | 2·4 | 3·5 | 4·3 |
| 3·1 මැණික් .. | 561 | 755 | 1,447 | 20 | 23 | 38 | 1·6 | 2·2 | 3·5 |
| 3·2 වෙනත් .. | 303 | 427 | 311 | 11 | 13 | 8 | 0·8 | 1·3 | 0·8 |
| 4. වර්ග නොකළ අපනයන (ඇ) .. | 2,021(ඉ) | 1,249 | 1,933(ඉ) | 73 | 38 | 51 | 5·6 | 3·7 | 4·7 |
| මුළු අපනයන (ආ) .. | 36,207 | 34,072 | 41,133 | 1,311 | 1,036 | 1,080 | 100·0 | 100·0 | 100·0 |

(අ) තෝරා ගත් අයිතමයන්.
(ආ) ගලපන ලදී.
(ඇ) ප්‍රතිඅපනයන ඇතුළත්ය.
(ඈ) තාවකාලික.
(ඉ) ගුවන් යානාවක අපනයනය ඇතුළත්ය.

පරිවර්තනතාවය :
1985 – විගැහි 1 = රුපියල් 27·63
1986 – විගැහි 1 = රුපියල් 32·90
1987 – විගැහි 1 = රුපියල් 38·10

මූලයන් : ශ්‍රී ලංකා රේගුව,
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව.

කාර්මික අපනයනවලින් ලද ඉපැයීම් 1986 දී රුපියල් දශ ලක්ෂ 15,878 (විගැහි දශ ලක්ෂ 483) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 20,004 (විගැහි දශ ලක්ෂ 525) දක්වා සියයට 9 කින් (රුපියල් වටිනාකම අනුව සියයට 26) සැළකිය යුතු ලෙස ඉහළ නැඟිණි. මෙම ඉහළ යාමත් සමඟ මුළු අපනයනවලින් කාර්මික අපනයනවල කොටස සියයට 49 දක්වා වැඩි විය. අපනයන අංශයේ මුල් තැන හිමි කරගෙන සිටි කෘෂිකාර්මික අපනයන අභිබවා යමින් ප්‍රථම වරට 1986 දී කාර්මික අපනයන හිමි කර ගත් ස්ථානය මේ අනුව තවදුරටත් තහවුරු වීම පෙන්නුම් කරයි. මෙම වර්ධනය විශාල වශයෙන් පිළිබිඹු වූයේ, 1986 දී රුපියල් දශ ලක්ෂ 9,629 (විගැහි දශ ලක්ෂ 293) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 12,897 (විගැහි දශ ලක්ෂ 339) දක්වා සියයට 16 කින් (රුපියල් වටිනාකම අනුව සියයට 34) තරම් විශාල ප්‍රමාණයකින් වැඩි වූ රෙදිපිළි හා ඇඟළුම් අපනයන අංශය තුළ ය. වෙනත් කාර්මික අපනයනවලින් ලද ඉපැයීම් රුපියල් වටිනාකම අනුව රුපියල් දශ ලක්ෂ 4,515 දක්වා සියයට 16 ක වර්ධනයක් පෙන්වුවත්, ඉකුත් වසරේ මෙන්ම විගැහි දශ ලක්ෂ 118 මට්ටමේම පැවතින. මෙම අපනයනවල 1986 දී වූ සියයට 33 ක සැළකිය යුතු වැඩි වීම සමඟ සසඳන විට, මෙය අයහපත් තත්ත්වයකි. 1987 ඉපැයීම්වල අඩු වර්ධනයට විශාල වශයෙන් හේතු වූයේ මත්ස්‍ය නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත සහ යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණවලින් ලද ඉපැයීම් අඩු වීමය. 1987 දී ඛණිජ තෙල් නිෂ්පාදිත අපනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,592 දක්වා රුපියල් වටිනාකම අනුව සියයට 10 කින් වැඩි වුව ද විගැහි වටිනාකම අනුව සියයට 5 කින් අඩු විය.

ඛණිජමය අපනයන ඉපැයීම්, රුපියල් දශ ලක්ෂ 1,182 (විගැහි දශ ලක්ෂ 36) සිට රුපියල් දශ ලක්ෂ 1,759 (විගැහි දශ ලක්ෂ 46) දක්වා සියයට 29 ක (රුපියල් වටිනාකම අනුව සියයට 49) සිත් ගන්නා සුළු වර්ධන අනුපාතිකයක් පෙන්විය. මෙයට මුළුමනින්ම හේතු වූයේ මැණික් අපනයන ඉපැයීම් 1986 දී රුපියල් දශ ලක්ෂ 755 (විගැහි දශ ලක්ෂ 23) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 1,447 (විගැහි දශ ලක්ෂ 38) දක්වා සියයට 65 කින් (රුපියල් වටිනාකම අනුව සියයට 92) ඉහළ යාමය. මෙම ඉපැයීම් වර්ධනයට, මැණික් අපනයන පරිමාව මෙන්ම මිළ ඉහළ යාම යන දෙකරුණම හේතු විය. අපනයන පරිමාව 1986 දී කැරට් දශ ලක්ෂ 4.9 සිට 1987 දී කැරට් දශ ලක්ෂ 5.4 දක්වා නැතහොත් සියයට 10 කින් වැඩි වූ අතර සාමාන්‍ය නැ.වි.ස. මිළ මේ කාලච්ඡේදය තුළ දී කැරට් එකක් රුපියල් 154 සිට රුපියල් 267 දක්වා සියයට 73 කින් ඉහළ නැඟිණි. මැණික් සඳහා ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් වූයේ තායිලන්තය, හොංකොං සහ ජපානයයි.

**ආනයන**

ගලපන ලද රේගු සංඛ්‍යාවලට අනුව, 1986 වසරේ රුපියල් දශ ලක්ෂ 54,559 ක් (විගැහි දශ ලක්ෂ 1,658) වූ මුළු ආනයන වියදම 1987 දී රුපියල් දශ ලක්ෂ 60,517 ක් (විගැහි දශ ලක්ෂ 1,588) විය. මේ අනුව, 1987 වසරෙහි ආනයන වියදම රුපියල් වටිනාකම අනුව සියයට 11 කින් වැඩි වුව ද, විගැහි වටිනාකම අනුව සියයට 4 කින් අඩු විය. මෙම පහත වැටීම, පාරිභෝගික භාණ්ඩ ආනයන සහ ආයෝජන භාණ්ඩ ආනයන තුළින් විශාල ලෙස පිළිබිඹු විණි.

1987 වසරෙහි දී ආනයන සංයුතිය තවදුරටත් වෙනස් විය. මුළු ආනයනවලින් පාරිභෝගික භාණ්ඩ ආනයන කොටස 1986 දී සියයට 22.5 සිට 1987 දී සියයට 22.8 දක්වා සුළු වශයෙන් ඉහළ නැඟුණු අතර, 1985 දී සියයට 54 සිට 1986 දී සියයට 52 දක්වා පහත වැටුණු අන්තර් භාණ්ඩ ආනයන කොටස 1987 දී සියයට 57 දක්වා තියුණු ලෙස ඉහළ නැඟුණි. මෙම වැඩි වීමට මුළුමනින්ම හේතු වූයේ, ඛණිජ තෙල් ආනයනවල කොටස සියයට 11 සිට සියයට 14 දක්වා ද, රෙදිපිළි සහ ඇඟළුම් ආනයනවල කොටස සියයට 11 සිට සියයට 13 දක්වා ද වැඩි වීමයි. මේ අතර, ආයෝජන භාණ්ඩ ආනයනවල කොටස පසුගිය වසරෙහි දී මෙන්ම සියයට 19 මට්ටමේම පැවතුණි.

## 1 . 31 සංඛ්‍යා සටහන

## ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව කෙරෙන වර්ගීකරණය

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු ආනයනයන්ගේ ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1985 | 1986 (අ) | 1987(ආ) | 1985 | 1986 | 1987 | 1985 | 1986 | 1987 |
| 1. පාරිභෝගික භාණ්ඩ .. .. .. | 10,462 | 12,256 | 13,804 | 378·7 | 372·5 | 362·3 | 19·4 | 22·5 | 22·8 |
| 1.1 ආහාර සහ පාන වර්ග .. .. | 5,906 | 6,746 | 7,451 | 213·8 | 205·0 | 195·6 | 10·9 | 12·4 | 12·3 |
| 1·1·1 සහල් .. .. .. | 1,089 | 1,052 | 681 | 39·4 | 32·0 | 17·9 | 2·0 | 1·9 | 1·1 |
| 1·1·2 පිටි .. .. .. | 206 | 90 | 96 | 7·5 | 2·7 | 2·5 | 0·4 | 0·2 | 0·2 |
| 1·1·3 සීනි .. .. .. | 1,985 | 1,764 | 2,385 | 71·8 | 53·6 | 62·6 | 3·7 | 3·2 | 3·9 |
| 1·2 වෙනත් .. .. | 4,556 | 5,510 | 6,353 | 164·9 | 167·5 | 166·7 | 8·4 | 10·1 | 10·5 |
| 2. අන්තර් භාණ්ඩ(ඉ) .. .. .. | 29,331 | 28,618 | 34,619 | 1,061·7 | 869·9 | 908·6 | 54·2 | 52·4 | 57·2 |
| 2·1 බණිජ තෙල් .. .. .. | 10,986 | 6,293 | 8,716 | 397·6 | 191·3 | 228·8 | 20·3 | 11·5 | 14·4 |
| 2·2 පොහොර .. .. .. | 1,579 | 1,282 | 1,074 | 57·2 | 39·0 | 28·2 | 2·9 | 2·4 | 1·8 |
| 2·3 රසායනික ද්‍රව්‍ය .. .. .. | 902 | 1,587 | 1,559 | 32·6 | 48·2 | 40·9 | 1·7 | 2·9 | 2·6 |
| 2·4 තිරිඟු .. .. .. | 2,765 | 2,371 | 2,147 | 100·1 | 72·1 | 56·3 | 5·1 | 4·4 | 3·5 |
| 2·5 රෙදිපිළි හා ඇඟළුම්(ඉ) .. .. | 3,799 | 6,353 | 8,086 | 137·5 | 193·1 | 212·2 | 7·0 | 11·5 | 13·4 |
| 3. ආයෝජන භාණ්ඩ .. .. .. | 10,387 | 10,556 | 11,332 | 376·0 | 320·9 | 297·4 | 19·2 | 19·4 | 18·7 |
| 3·1 යන්ත්‍ර සූත්‍ර හා උපකරණ .. .. | 4,769 | 5,828 | 6,639 | 172·6 | 177·1 | 174·2 | 8·8 | 10·7 | 11·0 |
| 3·2 ගමනාගමන උපකරණ .. .. | 2,499(ඈ) | 1,457 | 1,418 | 90·5 | 44·3 | 37·2 | 4·6 | 2·7 | 2·3 |
| 3·3 ගොඩනැගිලි ද්‍රව්‍ය .. .. .. | 899 | 907 | 709 | 32·5 | 27·6 | 18·6 | 1·7 | 1·7 | 1·2 |
| 4. වර්ග නොකරන ලද .. .. .. | 3,868 | 3,129 | 762 | 140·0 | 95·1 | 20·0 | 7·2 | 5·7 | 1·3 |
| මුළු ආනයන (ඇ) .. | 54,049 | 54,559 | 60,517 | 1,956·4 | 1,658·4 | 1,588·3 | 100·0 | 100·0 | 100·0 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) රේගු වාර්තාවල සටහන් නොවූ නැව් සහ ගුවන් යානාවල වටිනාකම් ඇතුළත් වේ.
(ඈ) ගලපන ලදී.
(ඉ) ඉහත දී පාරිභෝගික භාණ්ඩ වශයෙන් වර්ග කරන ලද රෙදිපිළි හා ඇඟළුම් ආනයන දැන් අන්තර් භාණ්ඩ වශයෙන් වර්ග කරනු ලැබේ.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන පොහොර ආනයනකරුවෝ,
ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාව,
සීමාසහිත එයාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

1987 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයනය සඳහා වූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 11,332 ක් (විගැහි දශ ලක්ෂ 297) විය. මෙය ඉකුත් වසරේ ඒ සඳහා වැය කරන ලද රුපියල් දශ ලක්ෂ 10,556 (විගැහි දශ ලක්ෂ 321) සමඟ සසඳන කල විගැහි වටිනාකම අනුව සියයට 7 ක අඩු වීමක් ද, රුපියල් වටිනාකම අනුව සියයට 7 ක වැඩි වීමක් ද පෙන්නුම් කෙරිණි. කෙසේ වෙතත්, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය සඳහා වූ වියදම වන රුපියල් දශ ලක්ෂ 709 (විගැහි දශ ලක්ෂ 19) සහ ප්‍රවාහන උපකරණ ආනයන වියදම වන රුපියල් දශ ලක්ෂ 1,418 (විගැහි දශ ලක්ෂ 37) පිළිවෙලින් සියයට 22 කින් (විගැහි වටිනාකම අනුව සියයට 33) සහ සියයට 3 කින් (විගැහි වටිනාකම අනුව සියයට 16) තියුණු ලෙස පහත වැටුණි. යන්ත්‍රෝපකරණ ආනයන වටිනාකම, විගැහි වටිනාකම අනුව සියයට 2 කින් සුළු වශයෙන් පහත වැටුණු නමුදු, රුපියල් වටිනාකම අනුව සියයට 14 කින් වැඩි විය.

1987 වසරෙහි දී රුපියල් දශ ලක්ෂ 34,619 ක් (විගැහි දශ ලක්ෂ 909) වූ අන්තර් භාණ්ඩ ආනයන වියදම, 1986 වසරෙහි වූ රුපියල් දශ ලක්ෂ 28,618 (විගැහි දශ ලක්ෂ 870) සමඟ සසඳන කල සියයට 21 ක (විගැහි වටිනාකම අනුව සියයට 4) වැඩි වීමක් පෙන්විය. කෙසේ වෙතත්, 1987 දී පොහොර, තිරිඟු ඇට සහ රසායනික ද්‍රව්‍ය වැනි අන්තර් භාණ්ඩ ආනයනය සඳහා වූ වියදම් සැළකිය යුතු ලෙස අඩු විය. පොහොර ආනයන වටිනාකම සියයට 16 කින් (විගැහි වටිනාකම අනුව සියයට 28) අඩු වූ අතර, තිරිඟු ඇට සහ රසායනික ද්‍රව්‍ය ආනයන වටිනාකම් පිළිවෙලින් සියයට 9 කින් (විගැහි වටිනාකම අනුව සියයට 22) සහ සියයට 2 කින් (විගැහි වටිනාකම අනුව සියයට 15) පහත වැටුණි. කෙසේ වෙතත්, මෙම අඩු වීම් 1986 වසරෙහි දී ඛණිජ තෙල් ආනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 6,293 (විගැහි දශ ලක්ෂ 191) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 8,716 (විගැහි දශ ලක්ෂ 229) දක්වා සියයට 20 කින් (රුපියල් වටිනාකම අනුව සියයට 39) වැඩි වීම මගින් විශාල වශයෙන් සමනය කෙරිණි. 1987 දී බොර තෙල්වල සාමාන්‍ය මිළෙහි මෙන්ම ආනයන පරිමාවෙහි ද මෙම වැඩි වීම් පිළිබිඹුවිණි. ආනයන පරිමාව 1986 දී බැරල් දශ ලක්ෂ 12.1 සිට 1987 දී බැරල් දශ ලක්ෂ 13.1 දක්වා වැඩි වූ අතර, සාමාන්‍ය ආනයන මිළ බැරලයක් විගැහි 13 සිට බැරලයක් විගැහි 14 දක්වා වැඩි විය. රෙදිපිළි ආනයන වටිනාකම 1986 දී රුපියල් දශ ලක්ෂ 6,353 (විගැහි දශ ලක්ෂ 193) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 8,086 (විගැහි දශ ලක්ෂ 212) දක්වා වැඩි වීම තවත් සැළකිය යුතු වෙනස් වීමක් විය. මෙම ආනයන ප්‍රධාන වශයෙන් ඇඟළුම් කර්මාන්තය සඳහා වූ අවශ්‍යතාවයන් සපුරාලනු පිණිස විය.

**1 . 32 සංඛ්‍යා සටහන**

**1987 ප්‍රධාන ආනයනයන්හි පරිමාව**

මෙට්‍රික් ටොන්

| මාසය | සහල් | තිරිඟු | සීනි | ඛණිජ තෙල් (බොර තෙල්) | පොහොර |
|---|---|---|---|---|---|
| ජනවාරි .. | 10,064 | 49,183 | 11,438 | 125,752 | 49,893 |
| පෙබරවාරි .. | 10,044 | 61,690 | 18,480 | 63,283 | 19,665 |
| මාර්තු .. | — | 33,277 | 72,450 | 156,200 | 37,302 |
| අප්‍රේල් .. | 19,938 | 52,423 | 69,501 | 186,077 | 28,538 |
| මැයි .. | 6 | 48,978 | 18,237 | 154,034 | 14,056 |
| ජුනි .. | 17 | 52,500 | 9,983 | 154,016 | 6,630 |
| ජූලි .. | 2,885 | 46,539 | 30,786 | 153,441 | 22,883 |
| අගෝස්තු .. | 14,016 | 54,000 | 22,802 | 154,285 | 6,692 |
| සැප්තැම්බර් .. | 155 | — | 34,121 | 158,303 | 29,984 |
| ඔක්තෝබර් .. | 12,975 | 125,032 | 29,482 | 158,052 | 14,187 |
| නොවැම්බර් .. | 12,552 | — | 201 | 158,046 | 36,242 |
| දෙසැම්බර් .. | 30,197 | 55,000 | 58,765 | 157,364 | 35,697 |
| එකතුව(අ) .. | 112,849 | 578,622 | 376,246 | 1,778,853 | 301,769 |

(අ) ගලපන ලදී.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව,
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන පොහොර ආනයනකරුවෝ,
ශ්‍රී ලංකා මහ බැංකුව.

පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම, 1986 දී රුපියල් දශ ලක්ෂ 12,256 සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 13,804 දක්වා සියයට 13 කින් වැඩි විය. නමුත් එම ආනයනයන් විගැහි වටිනාකම අනුව විගැහි දශ ලක්ෂ 373 සිට විගැහි දශ ලක්ෂ 362 දක්වා සියයට 3 කින් පහත වැටුණි. විගැහි වටිනාකම අනුව මෙම පහත වැටීම, පාරිභෝගික භාණ්ඩ ආනයනවල සියළුම කාණ්ඩයන් තුළින් පිළිබිඹු විණි. විශේෂයෙන්ම සහල් ආනයන වියදම 1986 වසරේ දී විගැහි දශ ලක්ෂ 32 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 18 දක්වා තියුණු ලෙස පහත වැටීම හේතු කොටගෙන ආහාර පාන ආනයන වියදම විගැහි දශ ලක්ෂ 205 සිට විගැහි දශ ලක්ෂ 196 දක්වා සියයට 5 කින් පහත වැටුණි. කෙසේ වෙතත්, 1987 දී මෙම කාණ්ඩය තුළ සීනි ආනයන වියදම එහි සාමාන්‍ය මිළ මෙන්ම ආනයන පරිමාව ද වැඩි වීම නිසා විගැහි දශ ලක්ෂ 63 දක්වා සියයට 17 කින් වැඩි වීම සඳහන් කළ යුතුය. වෙනත් පාරිභෝගික භාණ්ඩ ආනයන වටිනාකම ද 1986 දී විගැහි දශ ලක්ෂ 168 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 167 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. ඖෂධ වර්ග සහ ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිණී යන්ත්‍ර ආනයන වියදම් අඩු වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

**විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය**

1977 වසරෙහි හඳුන්වා දෙනු ලැබූ නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය, තීරු බදුවල සහ අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්තීන්හි තවත් සංශෝධනයන් සහිතව 1987 වසර තුළ අඛණ්ඩව ක්‍රියාත්මක විය.

1985 නොවැම්බර් මස දී රෙදිපිළි ආනයනය ලිහිල් කිරීමට අනුකූලව යමින් 1987 දී රෙදිපිළි ආනයන බදු තව දුරටත් අඩු කරන ලදී. මේ අනුව කෘතිම රෙදි සඳහා මීටරයකට රුපියල් 30 ක අවම බද්දක් හා කපු රෙදි සඳහා මීටරයකට රුපියල් 15 ක අවම බද්දක් සහිතව මී.ර.ගැ. වටිනාකමින් සියයට 60 දක්වා රෙදි පිළි ආනයන බදු මට්ටම අඩු කරන ලදී. මුල දී මෙම බදු මට්ටම මී.ර.ගැ. වටිනාකමින් සියයට 100 ක් හෝ කෘතිම රෙදි සඳහා මීටරයකට රුපියල් 40 ක් සහ කපු රෙදි සඳහා මීටරයකට රුපියල් 25 ක් වූ ඉහළ මට්ටමක විය.

කෙසේ වෙතත්, 1986 දී සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කරන ලද තිරිඟු ඇට ආනයන තීරු බද්ද 1987 වසරෙහි දී නැවත වරක් සියයට 20 දක්වා ඉහළ නංවන ලදී. ජනාධිපති තීරු බදු කොමිසම විසින් කරන ලද නිර්දේශයනට අනුව, දේශීය වී ගොවීන්ට ආරක්ෂණයක් සලසනු පිණිස මෙම බදු වැඩි කිරීම් සිදු කරන ලදී.

මීට අමතරව, ඕනෑම ආනයන කාණ්ඩයක් මත පනවනු ලබන උපරිම ආනයන බද්ද සියයට 60 ක් ලෙස නියම කරනු ලැබූ අතර, ආනයන බදුවලින් නිදහස්ව පැවති පොහොර, පොත්, කරවල සහ වෙනත් ආනයන භාණ්ඩ කිපයක් හැරුණුවිට අනෙකුත් සියළුම ආනයනික භාණ්ඩ මත සියයට 5 ක අවම ආනයන බද්දක් පැනවීය.

අපනයන අංශය සම්බන්ධයෙන් සලකන විට, සියළුම සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ මුහුදු නිෂ්පාදිත සඳහා වූ අපනයන බදු අවලංගු කරනු ලැබීය. සාම්ප්‍රදායික අපනයන සම්බන්ධව සළකන කල, තොග තේ සහ ඇසුරු තේ සඳහා අපනයන බද්ද පිළිවෙලින් කිලෝග්‍රෑමයක් රුපියල් 5.00 සිට රුපියල් 3.50 දක්වා ද, කිලෝග්‍රෑමයක් රුපියල් 3.50 සිට රුපියල් 2.00 දක්වා ද, රුපියල් 1.50 කින් අඩු කරන ලදී.

සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ මුහුදු නිෂ්පාදිත මත පනවා තිබූ අපනයන බදු ඉවත් කිරීමට අමතරව මුහුදු නිෂ්පාදිත, එළවළු, මස්, කුරුඳු, කජු වැනි සාම්ප්‍රදායික නොවන නිෂ්පාදිත සම්බන්ධයෙන් වූ අපනයන බලපත්‍ර අවශ්‍යතාවන් ද අවලංගු කරනු ලැබීය.

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි තවදුරටත් රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ ආනයන මත ඇ.එ.ජ., කැනඩාව සහ යුරෝපීය වෙළෙඳපොළවල් මගින් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබීය. ශ්‍රී ලංකාවේ අපනයන සම්බන්ධව සළකා බලන කල මෙම ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ඇඟළුම් අපනයන කෙරෙහි බලපාන ලදී. ඇඟළුම් අපනයන ඇ.එ.ජ., යුරෝපීය ආර්ථික හවුල, කැනඩාව, නෝර්වේ, ස්වීඩනය සහ පින්ලන්තය යන රටවල සලාක බෙදා වෙන් කිරීම්වලට තවදුරටත් යටත් විය.

ජාත්‍යන්තර ස්වාභාවික රබර් ගිවිසුම 1987 ඔක්තෝබර් මාසයේ දී අවසන් විය. ජිනීවාහි පැවති සාකච්ඡාවල දී නිෂ්පාදක රටවල් සහ පාරිභෝගික රටවල් අළුත් ගිවිසුමක් ඇති කර ගැනීම සම්බන්ධව එකඟතාවකට පැමිණුනි.

**අභ්‍යන්තර වෙළෙඳාම**

1977 දී වෙළෙඳාම ලිහිල් කිරීමත් සමඟ, වෙළෙඳ කටයුතුවල දී වෙළෙඳපොළ බලවේගයනට විශාල කාර්ය භාරයක් ඉටු කළ හැකි පරිදි අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය. මෙම අරමුණින් යුතුව, රජයේ මැදිහත් වීම අවම මට්ටමෙන් පවත්වාගෙන ගිය අතර, තරගකාරිත්වය රැක ගැනීම හා වෙළෙඳ ඒකාධිකාරයන් බිහි වීම වළක්වාලීම එමගින් බලාපොරොත්තු විය. රාජ්‍ය අංශයේ වෙළෙඳ ආයතනවල කාර්ය භාරය අඩු කිරීමෙන් තොග වෙළෙඳාම, සිල්ලර වෙළෙඳාම හා අනෙකුත් කටයුතුවලට පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිමත් කෙරිණි.

1987 අගෝස්තු මාසයේ දී ජාතික මිළ කොමිසම වෙනුවට සාධාරණ වෙළෙඳ කොමිසම පිහිටුවනු ලැබීය. ජාතික මිළ ප්‍රතිපත්තීන් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීමට අමතරව, ඒකාධිකාරී සංවිධාන, ඒකාබද්ධ සමාගම් සහ තරගකාරිත්වයට එරෙහි බලවේග පිළිබඳව කටයුතු කිරීමට අවශ්‍ය බලතල ද මෙම නව කොමිසම සතුව ඇත. විමසුමට ලක් වන වසර තුළ දී කොමිසම විසින් මිළ විමර්ශනයන් 52 ක් කරනු ලැබූ අතර පසුගිය වසරේ දී එම ගණන 56 ක් විය. මෙයට අමතරව, කොමිසම විසින්, කිරි පිටි බෙදා හැරීම සහ ඇලුමිනියම් ලෝහ තහඩු සැපයිම සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳව පරීක්ෂණ මෙහෙය වීය.

ඉකුත් වසරවල දී මෙන්ම, 'මහපොළ වෙළෙඳපොළවල්' සහ පාරිභෝගික සමිති සංවිධානය කිරීම මගින් වෙළෙඳපොළ පිළිබඳ පාරිභෝගිකයින්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා අවධානය යොමු කරන ලදී. 1987 දී, අළුතින් පාරිභෝගික සමිති 4,484 ක් පිහිටුවන ලද අතර, රටෙහි විවිධ ප්‍රදේශවල දී මහපොළ වෙළෙඳපොළවල් 14 ක් පවත්වන ලදී.

රාජ්‍ය වාණිජ සංවිධාන, පෞද්ගලික අංශය සමඟ වඩාත් තරගකාරී වීමට සහ අළුත් වෙළෙඳ වාතාවරණය යටතේ සිය වාණිජ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා විවිධ වෙළෙඳ කටයුතුවල නිරත විය. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (ස.තො.ස.) රටෙහි සමහර ප්‍රදේශ තුළ පවත්නා ආරක්ෂක තත්ත්වය ගැන සළකා අත්‍යවශ්‍ය වෙළෙඳ ද්‍රව්‍යවල සම්භාරක තොග පවත්වාගෙන යාම මගින් ආහාර සහ අනෙකුත් අත්‍යවශ්‍ය වෙළෙඳ ද්‍රව්‍ය මහජනතාවට සැපයීමේ දී මහඟු කාර්ය භාරයක් ඉටු කරන ලදී.

අභ්‍යන්තර වෙළෙඳාමේ දී විවිධ සේවා සමුපකාර සමිතිවල කාර්යයන් ප්‍රධාන වශයෙන් ආහාර මුද්දර ක්‍රමය යටතේ සහල්, පිටි, සීනි සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ වැනි මූලික ආහාර ද්‍රව්‍යයන් බෙදා හැරීමට සීමා විය. කෙසේ වෙතත්, අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදා හැරීම අඩපන වූ අභ්‍යන්තරික අර්බුදකාරී අවස්ථාවල සමුපකාර සමිතිවල වැදගත්කම වඩාත් පැහැදිලි විය.

## සංචාරක කර්මාන්තය

ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල තවදුරටත් පැවති සිවිල් කලබලකාරී තත්ත්වය, සංචාරක කර්මාන්තයේ අපේක්ෂිත පුනර්ජීවනය වළක්වාලීය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1987 දී මෙරටට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 1978 න් පසු වාර්තා වූ අඩුම මට්ටමට පහත වැටුණි.

1987 දී මෙරටට පැමිණි මුළු සංචාරකයින්ගේ සංඛ්‍යාව 182,620 ක් වූ, අතර එය ඉකුත් වසරේ වූ 230,106 ට වඩා සියයට 21 ක අඩු වීමක් විය. 1982 දී වාර්තා වූ, ඉහළම සංචාරක පැමිණීම් සංඛ්‍යාව වන 407,230 සමඟ සසඳන විට මෙය සියයට 55 කින් අඩු විය. ඒ අනුව, 1983 සිට උග්‍ර වූ සිවිල් කලබලවලින් ඉතාමත් තදබල ලෙස පහර වැදුණු කර්මාන්ත අතරින් එකක් ලෙස සංචාරක කර්මාන්තය හඳුන්වා දිය හැකිය.

**1 . 33 සංඛ්‍යා සටහන**

**සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛන 1986 - 1987**

| ශීර්ෂය | 1986 | 1985 ට වඩා ප්‍රතිශත වෙනස | 1987 | 1986 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් .. | 230,106 | - 10·6 | 182,620 | - 20·6 |
| 2. පැය 24 ට අඩු කාලයකට රට තුළ රැදෙන විදේශික මගීන්ගේ පැමිණීම් .. | 6,266 | - 36·6 | 2,417 | - 61·4 |
| 3. සංචාරක දින (රාත්‍රී) ගණන (දහස්) .. | 2,437 | + 3·0 | 2,414 | - 0·9 |
| 4. සංචාරකයින්ගෙන් දළ ලැබීම් | | | | |
| 4·1 රුපියල් දශ ලක්ෂ .. | 2,159·9 | + 7·6 | 1,900·0(අ) | - 12·0 |
| 4·2 එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ .. | 77·1 | + 4·2 | 64·5 | - 16·3 |
| 4·3 විගැහි දශ ලක්ෂ .. | 65·6 | - 9·6 | 49·9 | - 24·0 |
| 5. පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින්ගේ ගණන | | | | |
| 5·1 විනෝදය .. | 216,148 | - 7·6 | 162,782 | - 24·7 |
| 5·2 ව්‍යාපාරික කටයුතු .. | 10,084 | - 44·6 | 14,276 | + 41·6 |
| 6. කලාප අනුව පැමිණි ගණන | | | | |
| 6·1 බටහිර යුරෝපය .. | 143,022 | - 6·5 | 121,112 | - 15·3 |
| 6·2 ආසියාව .. | 66,150 | - 16·3 | 43,462 | - 34·3 |
| 6·3 උතුරු ඇමෙරිකාව .. | 9,232 | - 10·9 | 7,166 | - 22·4 |
| 7. මුළු සේවා නියුක්තිය .. | 53,479 | - 2·0 | 53,300 | - 0·3 |
| 7·1 සෘජු .. | 22,280 | - 2·0 | 22,200 | - 0·4 |
| 7·2 වක්‍ර .. | 31,199 | - 1·9 | 31,100 | - 0·3 |

(අ) තාවකාලිකයි.

මූලය : ලංකා සංචාරක මණ්ඩලය.

1987 දී සංචාරක පැමිණීම්වල සියයට 14 ක වැඩි වීමක් වාර්තා කළ නැගෙනහිර යුරෝපීය කලාපය හැරෙන්නට, අනෙක් සියළුම ප්‍රධාන කලාපවලින් වූ සංචාරක පැමිණීම් අඩු විය. මුළු පැමිණීම්වලින් සියයට 66 කට දායක වූ බටහිර යුරෝපය, තවදුරටත් මෙරටට සංචාරකයින් පැමිණෙන ප්‍රධාන කලාපය වුව ද, එම කලාපයෙන් පැමිණි සංඛ්‍යාව 1986 දී 143,022 සිට 1987 දී 121,112 දක්වා සියයට 15 කින් අඩු විය. ආරක්ෂක හේතූන් මත තලෙයිමන්නාරමෙහි තොටුපොළ බෝට්ටු සේවාව නවතා තැබීමත්, ශ්‍රී ලංකාවට ගොස් එන ඉන්දියානු ජාතිකයින්ට දෙනු ලබන බදු නිදහස් ආනයන දීමනා පිළිබඳව වූ දැඩි රෙගුලාසි තවදුරටත් ක්‍රියාත්මක වීමත් නිසා ඉන්දියාවෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සියයට 54 කින් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සංචාරක පැමිණීම් පිළිබඳ වැදගත්කම අතින් දෙවැනි තැන ගන්නා ආසියානු කලාපයෙන් පැමිණීම 1987 දී සියයට 34 කින් අඩු විය. උතුරු ඇමෙරිකාව සහ ඕස්ට්‍රලේෂියාව වැනි අනෙකුත් ප්‍රධාන කලාපවලින් වූ පැමිණීම් පිළිවෙලින් සියයට 22 කින් සහ සියයට 23 කින් අඩු විය.

ලංකා සංචාරක මණ්ඩලය විසින් ඇස්තමේන්තු කරන ලද පරිදි, 1987 දී සංචාරක කර්මාන්තයෙන් ලැබුණු දළ විදේශ විනිමය ඉපැයීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,900 ක් (විගැහි දශ ලක්ෂ 50) වූ අතර එය විගැහි වටිනාකම අනුව සියයට 24 ක අඩු වීමක් විය. 1982 දී වාර්තා වූ, විගැහි දශ ලක්ෂ 133 ක ඉහළම විදේශ විනිමය ඉපැයීම් ප්‍රමාණය සමඟ සසඳන විට 1987 ඉපැයීම් සියයට 62 ක් තරම් විශාල ප්‍රමාණයකින් අඩු විය.

1987 දීත් සංචාරක පැමිණීම් අඛණ්ඩව අඩු වූ බැවින් සංචාරක කර්මාන්තයේ රැකියා අවස්ථාවන් ද මේ වසරේ දී තවදුරටත් අඩු විය. කෙසේ වෙතත්, කොළඹ සහ මහනුවර එක් නව සංචාරක හෝටලය බැගින් විවෘත කළ බැවින් මෙම අංශයේ මුළු සේවා නියුක්ති ප්‍රමාණය අඩු වී ඇත්තේ 1986 දී 53,479 සිට 1987 දී 53,300 දක්වා සුළු ප්‍රමාණයකින් පමණක් බැව් ඇස්තමේන්තු කෙරිණි. 1987 වසරේ සංචාරක අංශයේ මුළු සේවා නියුක්ති ප්‍රමාණයෙන් දළ වශයෙන් 22,200 ක් පමණ මෙම කර්මාන්තයේ සෘජුව නියැලුණු අතර 31,100 ක් පමණ ඒ ආශ්‍රිත අංශයන්හි නියුක්ත විය.

1987 දී ශ්‍රේණිගත හෝටල් 128 ක් ක්‍රියාත්මක වූ අතර, ඒවායේ මුළු කාමර ධාරිතාව 9,921 ක් විය. 1986 දී ක්‍රියාත්මකව පැවති හෝටල් සංඛ්‍යාව වූ 131 සමඟ සසඳන විට මෙය සියයට 2 ක අඩු වීමක් විය. අතිරේක නවාතැන් අංශයෙහි ඒකක ගණන 1986 දී 106 සිට 1987 දී 104 දක්වා අඩු වූ අතර, ඒ අනුව මුළු කාමර සංඛ්‍යාව ද 1,187 සිට 1,172 දක්වා අඩු විය. සංචාරක හෝටල්වල ධාරිතා උපයෝගීකරණය තවදුරටත් අභිමත මට්ටම්වලට වඩා ඉතා පහත් මට්ටමක පැවතිණි. ශ්‍රේණිගත හෝටල්වල සාමාන්‍ය කාමර උපයෝගීකරණය 1986 දී සියයට 32.9 සිට 1987 දී සියයට 31.5 දක්වා අඩු විය.

ඉකුත් වසරේ දී මෙන්ම මේ වසරේ දී ද උතුරු සහ නැගෙනහිර වෙරළබඩ පිහිටි හෝටල් වසා තැබිණි. පෞරාණික නගර කලාපයේ හෝටල්වල ඉතා අඩු උපයෝගීකරණ මට්ටමක් පැවති අතර කොළඹ නගරය, මහ කොළඹ සහ දකුණු වෙරළබඩ කලාපවල හෝටල්වල සාමාන්‍ය උපයෝගීකරණ මට්ටමක් පැවතිණි.

1983 සිට හෝටල් කර්මාන්තය සඳහා රජය විසින් සලසනු ලැබූ සහන වැඩපිළිවෙල 1987 වසරේ දී ද තවදුරටත් ක්‍රියාත්මක විය. සියයට 100 ක් දක්වා වූ ණය ප්‍රතිලේඛනගත කිරීම ද ඇතුළුව, ණය ආපසු ගෙවීම් කල් තැබීමේ අවසරය 1989 මාර්තු දක්වා දීර්ඝ කරනු ලැබීමත්, අහිතකර බලපෑමට පාත්‍ර වූ හෝටල්වල කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන් සඳහා පොලී රහිත ණය පහසුකම් සැපයීමත් මෙම පියවරවලින් සමහරකි.